**හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහන (I වන අදියර)- 2018**

---

හරිත බලශක්ති සංවර්ධනය හා බලශක්ති කාර්යක්ෂමතා වැඩිදියුණු කිරීමේ ආයෝජන වැඩසටහනේ **(I වන අදියර)** 2018 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන **ආසියානු සංවර්ධන බැංකුව සහ ලංකා විදුලිබල මණ්ඩලය අතර 2014 නොවැම්බර් 20 දින එළඹි අංක එස්.ආර්.අයි 47037 දරන ව්‍යාපෘති ගිවිසුමේ II ව්‍යවස්ථාවේ 2.09 (අ) වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදි. පාර්ලිමේන්තුවට වාර්තා කල යුතු යැයි මා සළකන මාගේ අදහස් සහ නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.**

**1.2 ක්‍රියාත්මක කිරීම, අරමුණු, අරමුදල් යෙදවීම හා වැඩසටහනේ කාලසීමාව**

**වැඩසටහනේ පහසුකම් පරිපාලන අත්පොත අනුව, විදුලිබල, බලශක්ති හා ව්‍යාපාර සංවර්ධන අමාත්‍යාංශය නියෝජිතායතනය වන අතර ලංකා විදුලිබල මණ්ඩලය වැඩසටහන ක්‍රියාත්මක කිරීමේ ආයතනය වේ. පිවිතුරු විදුලිබල උත්පාදනය පද්ධති කාර්යක්ෂමතාව සහ විශ්වාසනීයත්වය වැඩිදියුණු කිරීම වැඩසටහනේ අරමුණු වේ. ව්‍යාපෘති පරිපාලන අත්පොත අනුව, ව්‍යාපෘතියේ ඇස්තමේන්තුගත මුළු පිරිවැය රු.මිලියන 28,509.80 කට සමාන ඇමරිකානු ඩොලර් මිලියන 220 ක් වන අතර එම මුදලින් මිලියන 23,325.50 ක සමාන ඇමරිකානු ඩොලර් මිලියන 180 ක මුදල ආසියානු සංවර්ධන බැංකුව විසින් ලබාදීමට එකඟ විය. ඉතිරි රු.මිලියන 5,183.60 ක මුදල ලංකා විදුලිබල මණ්ඩලය විසින් සපයනු ඇතැයි අපේක්ෂා කෙරේ. මෙම වැඩ සටහන 2015 පෙබරවාරි මස 02 දින වන විට සිය කටයුතු ආරම්භ කර ඇති අතර 2019 සැප්තැම්බර් 30 දින අවසන් කිරීමට නියමිතය.**

**1.3 තත්ත්වාගණනය කළ මතය**

**මාගේ වාර්තාවේ 2.1 වගුවෙන් විස්තර කර ඇති කරුණු වලින් වන බලපෑම හැර, වැඩ සටහනේ 2018 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා මූල්‍ය ක්‍රියාකාරිත්වය සහ එහි මුදල් ප්‍රවාහය ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.**

**1.4 මතය සඳහා පදනම**

**ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට (ශ්‍රී.ලං.වි.ප්‍ර) අනුකූලව මා විගණනය සිදු කරන ලදි. මෙම විගණන ප්‍රමිත යටතේ වූ මාගේ වගකීම, මෙම වාර්තාවේ මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම යන කොටසේ තවදුරටත් විස්තර කර ඇත. මාගේ මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.**

**1.5 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ කළමනාකරණයේ සහ පාලනය කරන පාර්ශවයන්ගේ වගකීම්**

**මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරව මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍ය වන අභ්‍යන්තර පාලනයන් තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.**

මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමේදී, ව්‍යාපෘතිය අඛණ්ඩව පවත්වාගෙන යෑමේ හැකියාව තීරණය කිරීම කළමනාකරණයේ වගකීමක් වන අතර, කළමනාකාරිත්වය ව්‍යාපෘතිය ඇවර කිරීමට අදහස් කරන්නේ නම් හෝ වෙනත් විකල්පයක් නොමැති විටදී මෙහෙයුම් නැවැත්වීමට කටයුතු කරන්නේ නම් හැර අඛණ්ඩ පැවැත්මේ පදනම මත ගිණුම් තැබීම හා ව්‍යාපෘතියේ අඛණ්ඩ පැවැත්මට අදාළ කරුණු අනාවරණය කිරීමද කළමනාකරණයේ වගකීමකි.

ව්‍යාපෘතියේ මූල්‍ය වාර්තාකරණ ක්‍රියාවලිය සම්බන්ධ වගකීම, පාලනය කරන පාර්ශවයන් විසින් දරනු ලබයි.
ව්‍යාපෘතිය වාර්ෂික සහ කාලීන මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවන පරිදි ස්වකීය ආදායම්, වියදම්, වත්කම් හා බැරකම් පිළිබඳ නිසි පරිදි පොත්පත් හා වාර්තා පවත්වාගෙන යා යුතුය.

**1.6** මූල්‍ය ප්‍රකාශන විගණනය සම්බන්ධයෙන් විගණකගේ වගකීම

සමස්තයක් ලෙස මූල්‍ය ප්‍රකාශන, වංචා සහ වැරදි නිසා ඇතිවන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර බවට සාධාරණ තහවුරුවක් ලබාදීම සහ මාගේ මතය ඇතුළත් විගණකගේ වාර්තාව නිකුත් කිරීම මාගේ අරමුණ වේ. සාධාරණ සහතිකවීම උසස් මට්ටමේ සහතිකවීමක් වන නමුත්, ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය සිදු කිරීමේදී එය සැමවිටම ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් අනාවරණය කරගන්නා බවට වන තහවුරු කිරීමක් නොවනු ඇත. වංචා සහ වැරදි තනි හෝ සාමූහික ලෙස බලපෑම නිසා ප්‍රමාණාත්මක අවප්‍රකාශනයන් ඇතිවිය හැකි අතර, මෙම මූල්‍ය ප්‍රකාශන පදනම් කරගනිමින් පරිශීලකයන් විසින් ගනු ලබන ආර්ථික තීරණ කෙරෙහි බලපෑමක් විය හැකි බවට අපේක්ෂා කෙරේ.

මා විසින් වෘත්තීය විනිශ්චය සහ වෘත්තීය සැකමුසු බවින් යුතුව ශ්‍රී ලංකා විගණන ප්‍රමිති ප්‍රකාරව විගණනය කරන ලදි. තවද,

- වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගේ අවදානම් හදුනාගැනීමේදී හා තක්සේරු කිරීමේදී අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලසුම් කිරීමෙන් වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවන්නා වූ අවදානම් මගහරවා ගැනීමට, ප්‍රමාණවත් සහ සුදුසු විගණන සාක්ෂි ලබා ගැනීම මාගේ මතයට පදනම් වේ. ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් සිදුවන බලපෑමට වඩා වංචාවකින් සිදු වන්නා වූ බලපෑම ප්‍රබල වන අතර, දුස්සන්ධානය, ව්‍යාජ ලේඛන සැකසීම, චේතනාන්විත මගහැරීම හෝ අභ්‍යන්තර පාලනයන් මගහැරීම වංචාවක් ඇතිවීමට හේතුවේ.

- අවස්ථාවෝචිතව උචිත විගණන පටිපාටි සැලැසුම් කිරීම පිණිස ව්‍යාපෘතියේ අභ්‍යන්තර පාලනය සම්බන්ධයෙන් අවබෝධයක් ලබා ගන්නා ලද නමුත්, අභ්‍යන්තර පාලනයේ සඵලදායිත්වය පිළිබඳ මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි.

- භාවිතා කරන ලද ගිණුම්කරන ප්‍රතිපත්තිවල සහ ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය සහ කළමනාකරණය විසින් කරන ලද සම්බන්ධිත හෙළිදරව් කිරීම්වල යෝග්‍යතාවය අගයන ලදි.

- හෙළිදරව් කිරීම් ඇතුළත් මූල්‍ය ප්‍රකාශනවල ඉදිරිපත් කිරීම, ව්‍යුහය සහ අන්තර්ගතය ඇගයීමට ලක්කළ අතර, ඒ සඳහා පාදක වූ ගනුදෙනු හා සිද්ධීන් උචිත හා සාධාරණ අයුරින් මූල්‍ය ප්‍රකාශනවල ඇතුළත් බව අගයන ලදි.

මාගේ විගණනය තුළදී හඳුනාගත් වැදගත් විගණන සොයාගැනීම්, ප්‍රධාන අභ්‍යන්තර පාලන දුර්වලතා හා අනෙකුත් කරුණු පිළිබඳව පාලනය කරනු ලබන පාර්ශවයන් දැනුවත් කරන ලදි.

## 2. මූල්‍ය ප්‍රකාශ පිළිබඳ අදහස් දැක්වීම

### 2.1 ගිණුම්කරණ අඩුපාඩු

| ගිණුම්කරණ අඩුපාඩු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | නිර්දේශය |
|---|---|---|---|
| විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා අනුව 2018 දෙසැම්බර් 31 දිනට පෙන්නුම් කරන රු.මිලියන 1,924 ක්වූ වියපැහැදම් වටිනාකම සමඟ වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන වල පෙන්නුම් කරන රු. මිලියන 1,888 ක්වූ වියපැහැදම් කල වටිනාකමට එකඟ නොවීම. | ණය ශේෂය අඩුවෙන් දැක්වේ. | මොරගොල්ල ජල විදුලිබල ව්‍යාපෘතිය වෙනුවෙන් ලැබුණු මුදල් ගිණුම් ගතකර නොතිබුණි. | උපයෝජිත ණය මුදල් විදේශ සම්පත් දෙපාර්තමේන්තුවේ වාර්තා සමඟ සැසඳීමට පියවර ගත යුතුය. |

### 2.2 නීති, රීති සහ රෙගුලාසි වලට අනුකූල නොවීම

පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.

| | නීති, රීති සහ රෙගුලාසි වලට යොමුව | අනුකූල නොවීම | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | මුදල් හා ක්‍රමසම්පාදන අමාත්‍යාංශයේ අංක එම්ඕඑෆ්පී/ඊආර්ඩී/2007/02 දරන 2007 අගෝස්තු 07 දිනැති චක්‍රලේඛය | වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන සෑම මූල්‍ය වර්ෂයකම මාර්තු 31 දින හෝ ඊට පෙර විගණකාධිපති වෙත ඉදිරිපත් කල යුතුය. කෙසේ වෙතත්, වැඩසටහනේ මූල්‍ය ප්‍රකාශන 2019 මැයි 15 දින ඉදිරිපත් කර තිබුණි. | චක්‍රලේඛයේ පරිදි ප්‍රධාන අවශ්‍යතාව සපුරා නොමැත. | ලංකා විදුලිබල මණ්ඩලයේ ඒකාබද්ධ මූල්‍ය ප්‍රකාශන අවසන් කිරීමෙන් පසුව විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති වල මූල්‍ය ප්‍රකාශන පිළියල කරනු ලැබේ. | චක්‍රලේඛ උපදෙස් පිළිපැදිය යුතුය. |

| | | | | | |
|---|---|---|---|---|---|
| (ආ) | ව්‍යාපෘති ගිවිසුමේ 2.09 (අ) වගන්තිය. | වැඩසටහනේ ගනුදෙනු වාර්තා කිරීමට ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර් ගිණුම් නඩත්තු කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධතිය දුර්වල වීම. | ලංකා විදුලිබල මණ්ඩලයේ සියළුම අංශ විසින් තම විෂය පථය යටතේ පවතින විදේශ අරමුදල් සපයන ව්‍යාපෘති වල මෙහෙයුම් වලට අදාලව වාර්තා කර තිබීම. | වැඩසටහනේග නුදෙනු වාර්තා කිරීම සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් වෙනම ලෙජර් ගිණුම් පවත්වා ගෙන යා යුතුය. |
| (ඇ) | මුදල් රෙගුලාසි 134(3) හා 2010 ජුලි 26 දිනැති අංක 05 දරන කළමනාකරණ විගණන චක්‍රලේඛය | වැඩසටහනේ ගනුදෙනු ලංකා විදුලිබල මණ්ඩලයේ අභ්‍යන්තර විගණන අංශයේ විගණනයට යටත්කර නොතිබුණි. | අභ්‍යන්තර පාලන පද්ධති දුර්වලවීම. | එය ඉදිරි මාස වලදී විගණනයක් සිදුකිරීමට සැලසුම් කර ඇති අතර 2019 දී ප්‍රමුඛතාවයක් ලෙස අවසන් කිරීමට නියමිතය. | වැඩසටහනේ මෙහෙයුම් වල කාර්යක්ෂමතාව හා ඵලදායීතාවය සහතික කිරීම සඳහා වැඩ සටහනේ මෙහෙයුම් අභ්‍යන්තර විගණන අංශය විසින් අඛණ්ඩවම සමාලෝචනය කල යුතුය. |
| (ඈ) | 2016 අප්‍රේල් 29 දිනැති අංක පීඊඩී/03/2016 දරන රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛය | සමාලෝචන කාලය තුල සේවකයන්ගේ වැටුපෙන් අඩු නොකර රු. මිලියන 34.77 ක් උපයන විට බදු වැඩසටහනෙන් ගෙවා තිබුණි. | වැඩසටහනේ මෙහෙයුම් ඒකකයේ පිරිවැය වැඩිවීම. | ලංකා විදුලිබල මණ්ඩලය විසින් සේවකයන්ගේ උපයනවිට බදු වගකීම දරා තිබුණි. | සේවකයන්ගේ දළ වැටුපෙන් උපයනවිට ගෙවන බදු අයකල යුතුය. |

## 3. භෞතික ප්‍රගතිය

### 3.1 ව්‍යාපෘතියේ ක්‍රියාකාරකම් වල භෞතික හා මූල්‍ය ප්‍රගතිය

**වැඩසටහනේ ක්‍රියාකාරකම් කොටස් 05 කින් සමන්විත වූ අතර වැඩසටහනේ එවැනි කොටස් අධීක්ෂණය හා මෙහෙයවීම ලංකා විදුලිබල මණ්ඩලයේ අංශ ප්‍රධානීන්ගේ විෂය පථයට යටත්විය. ඒ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

| | සංරචකය | විගණන ගැටළු | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|---|
| (අ) | ජල විදුලිබල උත්පාදනය | ජල විදුලිබල උත්පාදන ධාරිතාව ඉහළ නැංවීම සඳහා මොරගොල්ල ජල විදුලි බලාගාරය ඉදිකිරීම් සඳහා වූ ලංසු ලේඛන සමාලෝචනය කිරීම සඳහා ප්‍රදානය කරන ලද උපදේශන කොන්ත්‍රාත්තුව 2017 දෙසැම්බර් 27 වන දින අවසන් කර තිබූ නමුත්, ජල විදුලි බලාගාරයේ ඉදිකිරීම් කටයුතු සහ ඒ සඳහා යාන්ත්‍රික හා විදුලි පහසුකම් සැපයීම යනාදිය 2018 දෙසැම්බර් 31 දින වන විට ආරම්භක අවධියේ පැවතුණි. | දිගු කාලීන අවම පිරිවැය බලශක්ති උත්පාදන සැලැස්මේ අරමුණු සාක්ෂාත් කරගත නොහැක. | වෙනත් නියෝජිතායතන වල අනුමැතිය සහ ප්‍රසම්පාදන ආදිය සහ උපදේශකයන් පත් කිරීම ප්‍රමාද වීම හේතුවෙන් විදුලිබල උත්පාදන පිළිබඳ කටයුතු වසර 3 ½ ක් ප්‍රමාද වී පැවති අතර එය ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනයෙන් බැහැර වීම. | බැදීම් ගාස්තු පැනවීම වලක්වා ගැනීම සහ වැඩසටහනේ අරමුණු සාක්ෂාත් කර ගැනීම සඳහා ක්‍රියාකාරි සැලැස්ම අනුව වැඩසටහනේ ක්‍රියාකාරකම් ක්‍රියාත්මක කල යුතුය. |
| (ආ) | වැඩි දියුණු කල සම්ප්‍රේෂණ යටිතල පහසුකම් ධාරිතාව | විදුලබල සම්ප්‍රේෂණ යටිතල පහසුකම් වල ධාරිතාවය වැඩිදියුණු කිරීම සඳහා වන කප්පයිතුරේ උපපොල ඉදිකිරීම්, කෙරවලපිටිය, කටුනායක සහ ත්‍රිකුණාමලය උපපොල වල් වැඩි දියුණු කිරීමේ කටයුතු වල භෞතික ප්‍රගතිය, වැඩසටහනේ ක්‍රියාකාරකම් ආරම්භ කර වසර 04 ක් ගත වී ඇතත්, සියයට 75 ක මන්දගාමී මට්ටමක පැවතුණි. | -එම- | අදහස් දැක්වූයේ නැත. | -එම- |
| (ඇ) | කාර්යක්ෂම මධ්‍යම වොල්ටීයතා ජාලය | මඩකලපුව දිස්ත්‍රික්කය සඳහා වන කිලෝමීටර් 57 ක සහ කුරුණෑගල දිස්ත්‍රික්කයේ කිලෝමීටර් 20 ක අධිසැර විදුලි රැහැන් සවිකිරීම් කටයුතු සහ | -එම- | ලංකා විදුලිබල මණ්ඩලයේ පාලනයෙන් ඔබ්බට ගිය කුළුණු පිහිටි ස්ථාන සම්බන්ධ නීතිමය | -එම- |

| | | | | | |
|---|---|---|---|---|---|
| | | වව්නතිව් හා මාදම්පේ සමූහ ගත ඉදිකිරීම් කටයුතු වල භෞතික ප්‍රගතිය 2018 දෙසැම්බර් 31 දින වන විට සියයට 93.30 ක ප්‍රතිශතයක් විය | | ගැටළු වව්නතිව් රූහැන් මාර්ග වල ප්‍රගතිය සඳහා බලපා ඇත. | |
| (ඇ) | බලශක්ති කාර්යක්ෂමතාව සඳහා ඉල්ලුම් කළමනාකරණය | කාර්යක්ෂමතාවය ඉහල නැංවීම සඳහා ඉල්ලුම් කළමනාකරණ සංරචකය යටතේ ක්‍රියාත්මක කිරීමට අපේක්ෂා කරන ස්මාර්ට් මිනුම් නියමු ව්‍යාපෘතිය නියමිත දිනට වඩා මාස 04 ක් ගතවී ඇතත්, 2018 දෙසැම්බර් 31 දිනට අවසන් කර නොමැත. | ප්‍රතිපූර්ණය නොකල ශේෂය සඳහා බැඳීම් ගාස්තු අය කෙරේ. | අදහස් දක්වා නැත. | -එම- |

**3.2** කොන්ත්‍රාත් පරිපාලනය

| | විගණන ගැටළුව | බලපෑම | කළමනාකරණයේ ප්‍රතිචාරය | විගණකගේ නිර්දේශය |
|---|---|---|---|---|
| (අ) | ලංකා විදුලිබල මණ්ඩලය විසින් හසුරුවන සියළුම දායක අරමුදල් ව්‍යාපෘති අධීක්ෂණය කිරීමේ වගකීම දැරීම සිදුකරන්නේ අතිරේක සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති) විසින් වුවත්, වැඩසටහනේ ඉහත සඳහන් කොටස් 05 අධීක්ෂණය හා මෙහෙයවීම ලංකා විදුලිබල මණ්ඩලයේ විවිධ අංශ ප්‍රධානීන් යටතේ පැවතුණි. | අධීක්ෂණය හා මෙහෙයවීමේ යාන්ත්‍රණය දුර්වල අතර වැඩසටහනේ ක්‍රියාකාරකම් අවසන් කිරීමේ මන්දගාමී ප්‍රගතියක් පෙන්නුම් කරන ලදි. | 2010 අගෝස්තු 25 දින මණ්ඩල තීරණයට අනුව පුනරුත්ථාපන ව්‍යාපෘති හැර, සම්ප්‍රේෂණ හා උත්පාදන ව්‍යාපෘති ක්‍රියාත්මක කිරීම සඳහා පමණක් අතිරේක සාමාන්‍යාධිකාරි (ව්‍යාපෘති) වගකියනු ලබයි. | වැඩසටහනේ කටයුතු සමස්ථ අධීක්ෂණය හා මෙහෙයවීම සඳහා වගකිව යුතු ඉහළ කමනාකරණයේ නිළධාරියෙකු පත්කල යුතුය. |